**කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය - 2017**

**-----------------------------------------------------------------**

කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2002 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ 23 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------------

#### 2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

-----------------------------

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට පටහැනි අයුරින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයාගේ නිර්දේශ සහිතව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව 2006 දෙසැම්බර් 29 දින පරිගණක අධ්‍යයන ආයතනය තුළ ඇපයෙන් සීමිත සමාගමක් ලෙස සීමාසහිත තීක්ෂණ සමාගම ස්ථාපිත කර 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබුණි. 2009 මාර්තු 02 දින එය නැවතත් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබුණි.

සීමිත තීක්ෂණ සමාගම වෙනම නීතිමය ඒකකයක් ලෙස ස්ථාපිත කර තිබුණද පරිගණක අධ්‍යයන ආයතනයේ සම්පත් භාවිතා කරමින් ආයතන පරිශ්‍රය තුළ පවත්වාගෙන යනු ලැබේ. සමාගමේ ව්‍යවස්ථාවලියේ 32 වන වගන්තිය අනුව එම සමාගමේ කළමනාකරණ මණ්ඩලයට කොළඹ විශ්වවිද්‍යාල පරිගණක අධ්‍යයන ආයතනයේ නිලධාරීන් නිලබලයෙන් පත්විය යුතු බව දැක්වෙන අතර ඒ අනුව සීමිත තීක්ෂණ සමාගම, පරිගණක අධ්‍යයන ආයතනයෙහි පූර්ණ පාලන බලය සහිතව පවතින පරිපාලිත සමාගමකි. ඒ අනුව පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සීමිත තීක්ෂණ සමාගමේ මූල්‍ය ප්‍රකාශන සමග ඒකාබද්ධකර ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. කෙසේ වුවද, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළව පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තීක්ෂණ සමාගමේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර ඉදිරිපත් කර තිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකල වෙනස්කම්

---------------------------------

ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුළත් වත්කම් වර්ග 07 කට අදාළ පිරිවැය එකතුව රු.1,025,723,966 ක් වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව එම වත්කම්වල පිරිවැය රු. 1,024,178,700 ක් වූයෙන් රු. 1,545,266 ක පැහැදිලි නොකළ වෙනසක් පැවතුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

----------------------------------------

වර්ෂ දෙකකට වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.1,457,792 ක සේවා සැපයුම් ණය ශේෂ 41 ක් සහ රු.11,200 ක උත්සව අත්තිකාරම් ශේෂ 09 ක් වර්ෂ 03 සිට වර්ෂ 10 දක්වා වූ කාලයක් අය නොවී පැවති අතර එම ණය ශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2016 ජනවාරි 01 දිනැති අංක 01/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | බාහිර පාඨමාලාවන් සඳහා පවත්වනු ලබන විභාග කටයුතුවලදී ගෙවිය යුතු උපරිම සීමාවන් චක්‍රලේඛයේ දක්වා තිබුණද එම සීමාවන් ඉක්මවා සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් වෙත රු.166,375 ක් ගෙවා තිබූ අතර චක්‍රලේඛයේ සීමාවන් ඉක්මවා ගෙවීම් කිරීම් අඛණ්ඩව සිදුවන බව විගණනයේදී නිරීක්ෂණය විය. |
| (ආ) | 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන මුදල් චක්‍රලේඛයේ (ආ) ඡේදය. | අත්තිකාරම් කාර්යය නිමකල වහාම එම අත්තිකාරම් පියවිය යුතු වුවත්, අවස්ථා 11 කදී ලබාදී තිබූ එකතු වටිනාකම රු.347,000 ක් වූ අත්තිකාරම් මුදල් පියවීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය වූ අතර ප්‍රමාද වූ කාලය දින 33 සිට දින 169 දක්වා විය. |

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.28,844,440 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.24,205,857 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,638,583 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී උපාධි පාඨමාලා තුලින් රු. 25,378,916 ක ඌනතාවයක් ලබා තිබුන ද බාහිර පාඨමාලා මගින් රු. 34,436,009 ක අතිරික්තයක් ලබා තිබීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ පැවති රු.75,145,031 ක අතිරික්තය 2017 වර්ෂය වන විට රු.28,844,440 ක් දක්වා අඩු වී තිබුණු අතර මෙම කාල සීමාව තුළ මූල්‍ය ප්‍රතිඵලයෙහි සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය විය. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ක්ෂය වීම් සහ රජයට ගෙවූ බදු නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.180,507,872 ක්වූ ආයතනයේ දායකත්වය 2014 වර්ෂයේදී රු.155,717,099 ක් දක්වා අඩු වී තිබූ නමුත් 2015 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.247,737,952 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 4.1 කාර්ය සාධනය

-----------------

#### 4.1.1 සැලසුම් කිරීම

-------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී ප්‍රධාන අරමුණු පදනම් කරගෙන පිළියෙල කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් සඳහා වැයවන මුදල පමණක් දක්වා තිබුණි. තවද, කාර්යසාධන දර්ශක දක්වා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට පිළියෙල කර තිබුණු ප්‍රගති වාර්තාව මගින් මූල්‍ය හෝ කාර්යසාධන ප්‍රගතිය සැසඳීමට නොහැකි විය.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

-------------------------------------

සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම් 26 ක් ඉටු කිරීමට අපොහොසත් වී තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අභ්‍යන්තර උපාධි පාඨමාලා සඳහා බඳවා ගන්නා සිසුන්ට නේවාසිකාගාර පහසුකම් සැපයීම සඳහා 2010 සහ 2014 වර්ෂවලදී කුලී පදනම මත නේවාසිකාගාර ලබාගෙන තිබුණි. මේ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,912,800 ක් කුලී ලෙස ගෙවා තිබූ අතර ස්ථිර නේවාසිකාගාර පහසුකම් ලබාගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකස් කිරීමට කළමනාකාරීත්වයේ අවධානය යොමුකළ යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) ආචාර්යවරයෙකුගේ පරිවාස කාලය 2014 අගෝස්තු 03 දිනෙන් අවසන් වී තිබූ නමුත් පරිවාස කාලය තුල සම්පූර්ණ කළ යුතු Certificate for Teaching in Higher Education යන පාඨමාලාව 2018 අප්‍රේල් 27 දින දක්වාම සම්පූර්ණ කර නොතිබුණි. කෙසේ වුවද, පරිවාස කාලය දීර්ඝ කිරීමකින් තොරව එම ආචාර්යවරයා වෙත වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබාදීමට කොළඹ විශ්වවිද්‍යාලයේ නිවාඩු සහ සම්මාන කමිටුව (Leave and Awards Committee) 2017 ඔක්තෝබර් 30 දින තීරණය කර තිබුණි.

(ඇ) ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන් තිදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට අයකර ගත යුතු මුදල රු.2,032,948 ක් වූ අතර ඉන් ආචාර්යවරුන් දෙදෙනෙකුගෙන් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළ අය කර ගෙන නොතිබුණි.

### 4.3 කාර්යමණ්ඩල පරිපාලනය

-------------------------------

ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයෙහි පුරප්පාඩු 127 ක් පැවති අතර කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 25 දෙනෙකු ද දෛනික ගෙවීමේ පදනම මත හා කාර්ය පැවරුම් පදනම මත සේවකයින්

43 දෙනෙකු වෙත සේවා දිගු ලබාදෙමින් තවදුරටත් සේවයේ යොදවා තිබුණි. මෙසේ 2015 හා 2016 වර්ෂයන්හිද පුරප්පාඩු පැවති අතර සේවකයන් බඳවාගැනීමේ කාර්යයෙහි ප්‍රමාදයන් පැවතුණි.

## 5. තිරසාර සංවර්ධනය

---

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීම

---

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව ආයතනය විසින් තම විෂයය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබිණි.

ඒ හේතුවෙන් තම විෂය පථයට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා ඉලක්ක කරා ළඟා වියයුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක වෙත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයක්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---

### 6.1 අයවැය ලේඛනමය පාලනය

---

2016 ජනවාරි 01 දිනැති අංක 01/2016 දරන චක්‍රලේඛය මගින් බාහිර උපාධි පාඨමාලා, බාහිර පාඨමාලා, බාහිර විභාග හා සම්බන්ධිත කාර්යයන් පිළිබඳව ගෙවීම් සිදුකිරීමට මඟ පෙන්වීමක් ලබාදී තිබියදීත් ඊට පටහැනි ලෙස නව පාඨමාලා සඳහා අයවැය ලේඛන පිළියෙල කර ඒ සඳහා මූල්‍ය කමිටු හා පාලක සභා අනුමැතිය ලබාදී තිබුණි.

### 6.2 අභ්‍යන්තර විගණනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අභ්‍යන්තර විගණනය කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය වෙත පැවරී තිබුණද ප්‍රමාණවත් විගණනයක් සිදු නොවීම හේතුවෙන් 2011 අප්‍රේල් 01 දින ආයතනයේ විගණන කටයුතු පෞද්ගලික සමාගමක් වෙත පවරා තිබුණි. 2017 දෙසැම්බර් 31 දිනවන විට ප්‍රථම අර්ධ වර්ෂයට අදාළ විගණනය පමණක් සිදුකර තිබූ අතර විගණන වැඩසටහනට අනුව දෙවන අර්ධ වර්ෂයට අදාලව සිදුකල යුතු විගණනය මෙම වාර්තාවේ දින වන විටත් සිදුකර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 6.3. ප්‍රසම්පාදනයන්

---

2017 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්මේ අන්තර්ගත රු.මිලියන 18 ක් වටිනා ප්‍රසම්පාදනයන් 02 ක් සමාලෝචිත වර්ෂයේදී ඉටුකර නොතිබූ අතර ප්‍රසම්පාදනයන් 04 ක් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවා රු. 3,538,574 ක වියදම් දරා තිබූ බව නිරීක්ෂණය විය.

## 6.4 නොවිසඳී ඇති විගණන ඡේද

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් සේවකයින් 05 දෙනෙකුට හා ආචාර්යවරයින් දෙදෙනෙකු වෙත ලබාදී තිබූ එකතුව රු.344,006 ක සේවක ණය මුදල් වර්ෂ 05 සිට වර්ෂ 24 දක්වා කාලයක් අයනොවී පැවතුණි.

(ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව විශ්වවිද්‍යාල, මණ්ඩප හා විවෘත විශ්වවිද්‍යාල නියමයක්ම ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතුය අතර ඉන් අනතුරුව එය ක්‍රියාත්මක වන අතරතුරදී හැකිතාක් ඉක්මනින් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. එහෙත් 2002 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතන නියමාවලිය 2002 නොවැම්බර් 15 දිනැති අංක 1262/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකර තිබුණ මෙම වාර්තාවේ දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

(ඇ) පරිගණක අධ්‍යයන ආයතනයෙහි පරිපාලන හා අධ්‍යයන කටයුතු සඳහා ඉදිකර තිබූ මහල් 05 කින් සමන්විත ගොඩනැගිලි සංකීර්ණය පිහිටි ඉඩම කොළඹ විශ්වවිද්‍යාලය සතු වන අතර එම ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට මෙම වාර්තාවේ දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

## 07. පද්ධති හා පාලනයන්

--------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂකවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් පාලනය | වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම. |
| (ආ) සේවක මණ්ඩල කළමනාකරණය | කාර්ය මණ්ඩල අවශ්‍යතා අනුව අනුමත කාර්ය මණ්ඩල සංශෝධනය කිරීමට සහ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු නොකිරීම. |
| (ඇ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ප්‍රසම්පාදන සැලැස්ම අනුව ප්‍රසම්පාදන කටයුතු නොකිරීම. |
| (ඈ) අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණනය ප්‍රමාද වීම. |